Agriculture Modernization Project

## කෘෂිකර්ම අමාත්‍යාංශය

# කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවාගැනීම

## (මධ්‍යම පළාත හා උතුරු පළාත)

ලෝක බැංකුවේ, ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතනයේ මූල්‍ය සහාය සහිතව, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කුඩා ඉඩම් ගොවීන්හට, තරගකාරී හා අලෙවි කළ හැකි වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීමටත්, වෙළඳපළ අවශ්‍යතා සඳහා සැපයුම් කිරීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීමටත්, වැඩි වර්ධනය වූ වාණිජකරණය සඳහා ප්‍රවේශ වීමටත් සහායවීම පිණිස දේශ හවුල්කාරිත්ව උපායමාර්ග (CPS) වලට අනුකූලව කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිරිව ඇති කාලය වසර 2 වන අතර, ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 92.23 කි. (ලෝක බැංකු ණය අරමුදල් ප්‍රමාණය ඇමරිකන් ඩොලර් 64.23 වන අතර, යුරෝපා සංගමයේ ප්‍රදානය රුපියල් මිලියන 28.0 වේ)

උතුරු පළාතේ හා මධ්‍යම පළාතේ පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PPMUs) පවත්නා පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අංක 01/2019 දරන හා 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව පහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS 2) - තනතුරු 02 (මාතලේ හා යාපනය)**

**02. පළාත් මූල්‍ය කළමනාකරණ විශේෂඥ (PS 3) - තනතුරු 01 (මාතලේ)**

**01. පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - (PS 2)**

- **අවශ්‍ය සුදුසුකම් :**

I. කෘෂිකර්ම, ව්‍යාපෘති කළමනාකරණ, ගිණුම්කරණ, මූල්‍ය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යා, කළමනාකරණ, ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

**සමඟ**

සුදුසුකම් ලැබීමෙන් පසුව වසර 5 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ පළපුරුද්ද ඇතුළත්ව කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 11 ක පළපුරුද්ද.

II. කෘෂිකර්ම, ව්‍යාපෘති කළමනාකරණ, ගිණුම්කරණ, මූල්‍ය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යා, කළමනාකරණ, ව්‍යාපාර පරිපාලන උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම **හෝ** අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකම්,

**සහ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ආයතනික / වරලත් සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

**හෝ**

කෘෂිකර්ම, ව්‍යාපෘති කළමනාකරණ, ගිණුම්කරණ, මූල්‍ය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යා, කළමනාකරණ, ව්‍යාපාර පරිපාලන හෝ සමාන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමඟ වසර 04 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ පළපුරුද්ද ඇතුළත්ව අවම වශයෙන් වසර 09 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

III. කෘෂිකර්ම, ව්‍යාපෘති කළමනාකරණ, ගිණුම්කරණ, මූල්‍ය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යා, කළමනාකරණ, ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**සහ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ, ආයතනික / වරලත් සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

**සමඟ**

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ වසර 03 ක පළපුරුද්ද ඇතුළත්ව අවම වශයෙන් වසර 07 ක සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද.

IV. රජයේ දීපව්‍යාප්ත සේවයේ I ශ්‍රේණියේ නිලධාරියකු **හෝ** අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක් සමඟ I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

**02. පළාත් මූල්‍ය කළමනාකරණ විශේෂඥ (PS 3) - තනතුරු 01 (මාතලේ)**

- **අවශ්‍ය සුදුසුකම් :**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්,

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත්, අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්

**සමඟ**

කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 10 ක, සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද.

II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ, ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආයතනික වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්,

**සමඟ**

කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 08 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

III. රජයේ දීපව්‍යාප්ත සේවයේ අදාළ ක්ෂේත්‍රයේ 1 පංතියේ නිලධාරියෙකු හෝ සමාන තනතුරක්,

**සමඟ**

1 පංතියේ තනතුරක අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**03. තනතුරු දෙකටම අදාළ වේ :**

- විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල පළපුරුද්ද වාසිදායක වනු ඇති අතර, ලෝක බැංකුව අරමුදල් සැපයූ ව්‍යාපෘතිවල පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාව හිමිවේ.
- පරිගණක සාක්ෂරතා ප්‍රවීනතාව අත්‍යාවශ්‍ය වේ.
- අදාළ අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය වන විට වයස අවුරුදු 64 ඉක්මවූ අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් නොලබති.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබයි.

**වැටුප් පරිමාණය :**

2019.03.05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත වැටුප් පදනම් වේ.

**සේවා නියුක්ත කරලීමේ කොන්දේසි :**

සියලුම පත් කිරීම් 2019.03.05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව සිදු කෙරේ.

**අයදුම්පත් :**

සියලුම අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් සම්පූර්ණ ජීව දත්ත හා ඥාතී නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර හා සහතිකවල පිටපත් සහිතව ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත 2021 සැප්තැම්බර් 30 වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය,**
**අංක 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**

- දැනට රජයේ / අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මගින් යොමුකළ යුතුය.
- අයදුම්කරනු ලබන තනතුර හා පළාත, අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය,**
**"ගොවිජන මන්දිරය", බත්තරමුල්ල.**